4

Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2015-01-21 |

පැමිණිලිකරු :- කේ.ජී.ශ්‍රියානි ජයසිංහ මිය
පාසල පාර, තිබ්බටුවැව,
කැකිරාව.

වගඋත්තරකරු :- බී. විජේසුන්දර මයා,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක,
කලාප අධ්‍යාපන කාර්යාලය,
කැකිරාව.

<u>පැමිණිලි අංකය :- **HRC/AP/92/2015(W)**</u>

ඉහත පැමිණිලිකාරිය විසින් 2015.02.27 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, වගඋත්තරකරුවන් විසින් නීත්‍යානුකූල විධිවිධානවලට පටහැනිව තමාව ස්ථාන මාරු කිරීමෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවට කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාරිය 2006.01.24 දින ශ්‍රී ලංකා ගුරු සේවයේ කලා උපාධිධාරිනියක ලෙස පත්වීම් ලද බවත්, එදින සිට අ\බැදීවැව විද්‍යාලයේ අති දුෂ්කර සේවයේ වසර 5 ½ක් සේවය කරන ලද බවත්, ඉන් අනතුරුව වර්ෂ 2011.07.21 දින ස්ථාන මාරුවීමක් ලබා වර්තමාන සේවා ස්ථානය වන අ\තිබ්බටුවැව මහ විද්‍යාලයට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. එසේම දැනට පැමිණිලිකාරියගේ පත්වීමට අදාලව විදුහල්පති විසින් සපයන ලද කාල සටහනකට අනුව සේවය කරමින් සිටි බවද, එසේ සිටියදී වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2015.02.12 දිනැති ස්ථාන මාරු ලිපිය මගින් සේවා අවශ්‍යතාවය මත අ\ඇඹුල්ගස්වැව ප්‍රාථමික විද්‍යාලයට පැමිණිලිකාරියව ස්ථාන මාරු කර ඇති බවද සඳහන් කර ඇත. මෙම ස්ථාන මාරු කිරීම නීතියට පටහැනිව සිදුකර ඇති හෙයින් එය අවලංගු කරදීමට කටයුතු කරදෙන ලෙසට පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

මෙම පැමිණිල්ලට අදාලව කරුණු පරීක්ෂා කිරීම සඳහා 2015.06.23 දින පැවති මූලික පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, මෙම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කින්සි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 2694924 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 2689064 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ස්ථාන මාරු කිරීම නීත්‍යානුකූලව සිදුකර ඇති බවයි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් නැවත කලාප ගුරු මාරු මණ්ඩලය වෙත කරුණු වාර්තා කර නිශ්චිත නිගමනයක් දැනුම්දීමට වගඋත්තරකරු එහිදී එකඟ වී ඇත. කෙසේ වෙතත් වගඋත්තරකරු 2015.07.08 දිනැති ලිපිය මගින් ගුරු මාරු මණ්ඩලයේ වාර්තාවක් ඉදිරිපත් කර ඇතත්, පැමිණිල්ලට අදාළ ගැටළුව සම්බන්ධයෙන් නිශ්චිත විසඳුමක් ලබාදී නොමැති බව නිරීක්ෂණය වේ. එසේම මෙම කොමිෂන් සභාව මගින් තීන්දුවක් ලබාදුන් පසු ඒ අනුව කටයුතු කරන බව පැමිණිලිකාරිය වෙත වාචිකව දැනුම් දී ඇති බවද දන්වා ඇත.

**නෛතික පසුබිම :-**

කුමන පදනමක් මත හෝ සිදුකරනු ලබන ගුරු සේවයේ ස්ථාන මාරු කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007.12.13 දිනැති අංක 2007\20 දරණ ගුරු මාරු ප්‍රතිපත්ති චක්‍ර ලේඛනයට අනුකූලව සිදුකළ යුතු වන අතර, අදාළ නෛතික විධිවිධාන අනුගමනය කිරීම නීතියේ සමාන රැකවරණය හා වෙනස්කමකට ලක්නොවීම යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා ඉතා වැදගත් වේ.

ගුරු සේවාවේ ස්ථාන මාරු කිරීම් සිදුකිරීම සඳහා ගුරු මාරු මණ්ඩල පිහිටුවීම, ඒවායේ සංයුතිය හා ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව විධිවිධාන, එකී චක්‍ර ලේඛනයේ අඩංගු වන අතර, ස්ථාන මාරු කිරීම් කළයුතු ආකාරය, එහිදී ගුරු මාරු මණ්ඩලයේ වගකීම, අභියාචන කාර්ය පටිපාටියද සඳහන් කර ඇත. එසේම මෙම පැමිණිල්ලට අදාළ කරගත යුතු සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමට අදාළ නෛතික විධිවිධාන උක්ත චක්‍රලේඛයේ 2.4(i) යටතේ සඳහන් කර ඇත.

**නිරීක්‍ෂණ :-**

පැමිණිලිකාරියව ගුරු සේවය සඳහා පත් කර ඇත්තේ, 2006.01.04 වන දින වන අතර, ඇයට මුල් පත්වීම ලබාදී ඇත්තේ අ\බැදිවැව විද්‍යාලයට වේ. අනතුරුව පැමිණිලිකාරිය 2011.07.21 දින සිට වර්තමාන සේවා ස්ථානය වන අ\තිබ්බටුවැව මහ විද්‍යාලයට ස්ථාන මාරු කර ඇති බව නිරීක්ෂණය වේ.
එසේම වර්තමාන සේවා ස්ථානයේ පැමිණිලිකාරියට නිශ්චිත කාල සටහනක් පැවති බවද, එය ඇයගේ පත්වීම් ලිපියට අදාළ බවද, පත්වීම් ලිපියේ සඳහන් ඉගැන්වීම් කළයුතු කාල පරිච්ඡේද සංඛ්‍යාව අනුකූල බවද නිරීක්‍ෂණය වේ.

වගඋත්තරකරුගේ 2015.02.12 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරිය අ\ ඇඹුල්ගස්වැව විද්‍යාලයට ස්ථාන මාරු කර ඇති බවත්, එකී ස්ථාන මාරු කිරිමට හේතුව සේවා අවශ්‍යතාවය ලෙස සඳහන් කර ඇති බවත් එකී ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය 2015.02.19 දිනැතිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. නමුත් එකී අභියාචනයට පිළිතුරු නොලැබීම මත නැවත 2015.03.18 දිනැතිවද පැමිණිලිකාරිය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

01. පැමිණිලිකාරිය සිය මුල් පත්වීම් ලිපියට අනුකූලව අවශ්‍ය සේවා කාලය අති දුෂ්කර පාසලක සේවය කිරීමෙන් අනතුරුව වර්තමාන සේවා ස්ථානයට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති බවත්, අනතුරුව ඇය විසින් ඇයගේ පත්වීමට අදාළ නිශ්චිත කාල සටහනකට අනුව අවශ්‍ය කාලච්ඡේද ප්‍රමාණය ඉගැන්වීම් කරමින් වර්තමාන සේවා ස්ථානයේ සේවය කර ඇති බවත් නිගමනය කළ හැක.

02. පැමිණිලිකාරියව වර්තමාන සේවා ස්ථානයෙන් ස්ථාන මාරු කිරීම 2007\20 දරණ ගුරු මාරු ප්‍රතිපත්ති චක්‍ර ලේඛනයේ 2.4(i) විධිවිධානයන් අනුව සිදුකර ඇති නමුත් එකී චක්‍ර ලේඛයේ 2.4(i) විධිවිධානවලට අනුව එකී ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් ගුරු මාරු මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොමැති බව නිගමනය කළ හැක. ඉහත කී ස්ථනමාරු කිරීම පිළිබඳව ගුරුමාරු මණ්ඩලය දැනුවත් කරන ලද බවට වගඋත්තරකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැහැදිලිව සනාථ කර නොමැති අතරම ස්ථානමාරු කිරීමට හේතුව වන සේවා අවශ්‍යතාවයද පැහැදිලි කිරීමට අසමත් වී ඇත.

03. තවද ඉහත කී ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පැමිණිලිකාරියගේ අභියාචනය පිළිබඳව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැති අතර එකී අභියාචනය අභියාචන මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර, තීරණයක් පැමිණිලිකාරියට ලබාදීමට කටයුතු කර නොමැති බවද තහවුරු වී ඇත. අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී 2007\20 චක්‍ර ලේඛයේ 3:4 (VI) අනුව අභියාචනයට පිළිතුරු ලැබෙන තෙක් කලින් සේවය කරන ලද පාසලේම සේවයට වාර්තා කළ හැකි නමුත් වගඋත්තරකරුගේ උපදෙස් මත මෙම පැමිණිලිකාරිය සේවයට වාර්තා කිරීම විදුහල්පතිවරයා විසින් වැළැක්වීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් පරීක්ෂණ අතරතුර මෙම කොමිෂන් සභාවේ මැදිහත්වීම මත එකී අභියාචනයට

පිළිතුරු ලබාදෙනතෙක් එම පාසලේම සේවය කිරීමට විදුහල්පතිවරයා විසින් අවස්ථාව ලබාදී ඇතත්, නව සේවා ස්ථානයට වාර්තා නොකිරීම මත පැමිණිලිකාරියගේ වැටුප් නතර කිරීමට වගඋත්තරකරු විසින් කටයුතු කර ඇති බවද පෙනේ. ඒ අනුව වගඋත්තරකරු විසින් ඉහත කී චක්‍රලේඛයේ 3:4 (VI) උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව නිගමනය කළ හැක.

04. මෙම කොමිෂන් සභාවේදී පැවති මූලික පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ ගැටළුව සම්බන්ධයෙන් ගුරු මාරු මණ්ඩලයෙන් කරුණු ඉදිරිපත් කර විසඳුමක් ලබා ගැනීමට එකඟතාවය පළ වුවද, 2015.07.07 දින පැවති මාරු මණ්ඩලයේ සාකච්ඡා වූ කරුණු වලට අනුව පැමිණිලිකාරියට විසඳුමක් ලබාදීමට වගඋත්තරකරු කටයුතු කර නොමැත.

ඉහත සියළු කරුණු සළකා බැලීමේදී වගඋත්තරකරු විසින් අදාළ නෛතික විධිවිධානවලට පටහැනිව කටයුතු කර ඇති බව පෙනීයන හෙයින් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

i. පැමිණිලිකාරිය වෙත 2015.02.12 දිනැතිව ලබාදී ඇති ස්ථාන මාරු කිරීම අවලංගු කිරීම සහ ඇය සේවය කරන පාසලේම සේවය කිරීමට අවස්ථාව ලබාදීමටත්, ඉන් අනතුරුව යම් සේවා අවශ්‍යතාවයක් පවතින්නේ නම් අදාළ නෛතික විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වනු ලැබේ.

ii. එසේම අත්හිටුවා ඇති පැමිණිලිකාරියගේ වැටුප සියළුම හිඟ වැටුප් සමඟ ලබාදීමට කටයුතු කළ යුතු බවද දන්වනු ලැබේ.

iii. තවද පැමිණිලිකාරියට සේවයට වාර්තා කිරීමට අවස්ථාව ලබා නොදුන් දින කිහිපය පිළිබඳව විධිමත් ලෙස කරුණු පරීක්ෂා කර, ඒ සඳහා විශේෂිත නිවාඩු අනුමත කරදීමට කටයුතු කළ යුතු බවටද වගඋත්තර පාර්ශවය වෙත දන්වනු ලැබේ.

2016.02.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

| HUMAN RIGHTS COMMISSION OF SRI LANKA |
| --- |
| CHAIRMAN |
| |
| COMMISSIONERS |
| |
| |
| |
| |

පිටපත :- මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,

B/